# ‘ගැහැනුන්ට සහ පිරිමින්ට පොදු වූ අමුඩයෙන් ඇරඹි’ යට ඇඳුමේ කතාන්දරය



ඈත අතීතයේ ගැහැනු සහ පිරිමි දෙපාර්ශවය ම යට ඇඳුම ලෙස ‘අමුඩය’ ඇඳි බව ඔබ දන්නවා ද? ඇතැම් විට එය ඔබ මවිතයට පත් කරවනසුලු කාරණයක් විය හැක.

නමුත් ඉතිහාසය දෙස බැලීමේදී එහි සත්‍යතාව පිළිබඳව අපට අවබෝධ වනු ඇත.

යට ඇඳුම් පිළිබඳව අධ්‍යයනයේ නිරත විශේෂඥයින්ගේ මතය නම්, අමුඩය යට ඇඳුම්වල මුල් ම ආකාරය බව ය.

කෙසේ වෙතත්, යට ඇඳුම්වල ඉතිහාසය යුග ගණනාවක් පුරා බොහෝ විට නොසලකා හරින ලද මාතෘකාවක් බවට පත්ව තිබුණු බව, ඒ පිළිබඳව අධ්‍යයනය කරන විශේෂඥයෝ පෙන්වා දෙති.

එසේ වුව ද යට ඇඳුම් මානව ශිෂ්ටාචාරයේ වැදගත් අංගයක් වන අතර ම එය සමාජ සම්මතයන් සහ අවශ්‍යතා හැඩගැස්වීමෙහි ලා ද විශේෂ කාර්යභාරයක් ඉටු කර තිබේ.

මේ, මීට වසර 5,000කට පමණ පෙර අප අතරට පැමිණි, නමුත් අපට මග හැරුණු යට ඇඳුම්වල ඉතිහාසය දෙස ආපසු හැරී බැලීමකි.

## යට ඇඳුමක් කියලා කියන්නේ මොකක් ද?

යට ඇඳුම්වල ඉතිහාසය සොයා යාමට පෙර එය නිසි ලෙස නිර්වචනය කර ගැනීම අපගේ අරමුණ වෙත ළඟා වීම වඩා ත් පහසු කරනු ඇත.

බීබීසී සිංහල මෙම කාර්යය සඳහා ශ්‍රී ලංකා මොරටුව විශ්වවිද්‍යාලයේ පේෂකර්ම සහ ඇඟලුම් ඉන්ජිනේරු විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය අයේෂා වික්‍රමසිංහ සමග සංවාදයක යෙදුණෙමු.

ආචාර්ය අයේෂා වික්‍රමසිංහ ශ්‍රී ලංකාවේ කාන්තා යට ඇඳුම් ඉතිහාසය පිළිබඳව ද පර්යේෂණය කළ, පේෂකර්ම සහ ඇඟලුම් ඉන්ජිනේරු විද්‍යා විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකි.

ඇය සඳහන් කළ පරිදි යට ඇඳුමක් යනු, සමට ඉතා සමීපව පළඳින ඇඳුම් කාණ්ඩයකි. එය ශරීරයට දෙවන සමක් ලෙස ක්‍රියා කරයි.

”අපේ සමත් එක්ක මුලින් ම ස්පර්ශ වන යම් ආවරණයක් අපිට යට ඇඳුමක් කියලා කියන්න පුළුවන්. යට ඇඳුම තමයි වැඩි දියුණු වෙලා අපි මේ එළියට අඳින ඇඳුම නිර්මාණය වෙන්නේ. යට ඇඳුම තමයි මූලික ම ඇඳුම හැමෝම ඇඳපු,” ඇය අපගේ සංවාදයට මුල පිරුවා ය.

ජොඈන් ඊ. බ්ලෙයාර් 1992 පළ වූ සිය Fashion Terminology කෘතියේ යට ඇඳුම් අර්ථ දක්වන්නේ, පිටත ඇඳුම් යටින් ඇඳි ඇඳුම් කාණ්ඩයක් ලෙස ය. ඊට අමතරව, යට ඇඳුම් පිටත ඇඳුම් ලෙස ආරම්භ වී ක්‍රමයෙන් යට ඇඳුම් ලෙස ඇඳීමට පටන් ගත් බව එලිසබෙත් යුවින්ග් 1971 පළවූ සිය Fashion in Underwear කෘතියේ සඳහන් කර ඇත.

මේ බව ආචාර්ය අයේෂා වික්‍රමසිංහ ඇයගේ Evaluating the History of Women's Underclothing of Sri Lanka පර්යේෂණයේ ද සඳහන් කර ඇත.

## මුල් ම යට ඇඳුම මොකක් ද? මුලින් ම ඇන්දේ කවුද?

යට ඇඳුම්වල මුල් ම ආකාරය ආසන්න වශයෙන් අමුඩය (loincloth) යැයි සැලකේ. අතීතයේදී එය කාන්තා සහ පිරිමි යන දෙපාර්ශවය ම ඇඳ ඇති බව ද සඳහන් ය

”අපේ සමත් එක්ක මුලින් ම ස්පර්ශ වන යම් ආවරණයක් අපිට යට ඇඳුමක් කියලා කියන්න පුළුවන්. යට ඇඳුම තමයි වැඩි දියුණු වෙලා අපි මේ එළියට අඳින ඇඳුම නිර්මාණය වෙන්නේ. යට ඇඳුම තමයි මූලික ම ඇඳුම හැමෝම ඇඳපු,” ඇය අපගේ සංවාදයට මුල පිරුවා ය.

යට ඇඳුම්වල උපත සිදු වූයේ, වසර 5000කට පමණ පෙර ය.

ආචාර්ය අයේෂා වික්‍රමසිංහ පෙන්වා දෙන පරිදි, ලෙස්ලි ස්කොට් නමැති කතුවරිය 2010 පළවූ සිය 'Lingerie: A modern Guide' නමැති ග්‍රන්ථයේ එය සඳහන් කර තිබේ.

යට ඇඳුම්වල මුල්ම ආකාරය ආසන්න වශයෙන් අමුඩය (loincloth) යැයි සැලකේ. අතීතයේදී එය කාන්තා සහ පිරිමි යන දෙපාර්ශවය ම ඇඳ ඇති බව ද සඳහන් ය.

එය ශ්‍රී ලාංකික අපට ද අදටත් හුරුදු පුරුදු වස්ත්‍රයකි. ඒ, අමුඩය මෙරට කෘෂිකර්මාන්තය හා බැඳි වස්ත්‍රයක් වූ බැවිණි. නමුත් එය අදටත් ලොව වෙනත් කලාපවල ද දැකගත හැකි අතර එහි හැඩය ද ඒ අනුව වෙනස් වී ඇති බව නිරීක්ෂණය කළ හැකි ය.

”ලෝකය ගත්තත් අමුඩයෙන් තමයි යට ඇඳුම කියන එක දියුණු වෙලා එන්නේ,” ආචාර්ය අයේෂා වික්‍රමසිංහ එය තවදුරටත් පැහැදිලි කළා ය.

ඇය පෙන්වා දුන්නේ, යට ඇඳුම්වල ආරම්භය කාන්තාවන් හා බැඳී ඇති බවට විශ්වාස කෙරෙන බව ය. කාන්තාවන් ඔසප් වීමේදී ඒ සඳහා භාවිත කළ යම් ආවරණයක් ලෙස යට ඇඳුම් ආරම්භ වන්නට ඇති බව තමා අධ්‍යයනය කළ තොරතුරු අනුව පෙනී යන්නේ යැයි ඇය පැවසුවා ය.

”මොක ද පිරිමියෙකුට එහෙම අර විශේෂ අවශ්‍යතාවක් තිබිලා නැහැ. මේක ගැහැනිය කියන කෙනා මේ ලෝකෙට ජනිත වෙච්ච දවසේ සිට වෙන දෙයක් නේ. ඒ කියන්නේ මනුෂ්‍යයා කියන කෙනා ඉස්සරහට ගෙනියන්න, මේ ඔසප් වීම අවශ්‍යයි. එතකොට අපිට කියන්න බැහැ, ආ... ගෑනු ඉස්සර හිටියා ඒ අයට ඒක තිබ්බේ නැහැ කියන්න. එතකොට කොහොම ද හිටියේ? ඇත්තට ම එහෙම ඉන්න බැහැ,” ඇය තවදුරටත් පැවසුවා ය.

අතීත මානවයා ”ගස් සුඹුළු” ඒ සඳහා භාවිත කරන්නට ඇති බව ත් එය රඳවා ගැනීමට අමුඩය වැනි යමක් යොදා ගන්නට ඇති බව ත් ඇය පෙන්වා දුන්නා ය.

බාබියර් සහ බූෂා 2004 වසරේ පළවූ The Story of Lingerie කෘතියේ සඳහන් කර ඇත්තේ, කාන්තාවන් සඳහා වූ පළමු යට ඇඳුම් නවීන සනීපාරක්ෂක තුවාවලට සමාන සනීපාරක්ෂක උපකරණයක් බව ය.

## යට ඇඳුම් ඇන්දේ ඇයි?

අද වන විට සෑම සමාජයක ම පාහේ යට ඇඳුම් සඳහා ඇත්තේ ප්‍රමුඛ තැනකි. එය හුදෙක් සනීපාරක්ෂාව සඳහා පමණක් නොව විලාසිතාවක් ලෙස ද දැන් භාවිත වෙයි.

නමුත් අතීත මානවයාගේ යට ඇඳුම් ඇඳීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ කුමක් ද?

ආචාර්ය අයේෂා වික්‍රමසිංහ පෙන්වා දුන්නේ, සනීපාරක්ෂාව පමණක් මුල් කරගෙන ඔවුන් යට ඇඳුම් නොඇඳි බව ය. වර්තමානය මෙන් ලිංගික ආකර්ෂණය ඇති කර ගැනීමේ අරමුණින් ද අතීත මානවයා යට ඇඳුම් ඇඳි බව ඇය පැහැදිලි කළා ය.

”ඇත්තට ම හයිජීන් කියන එකටත් වැඩිය, මම අර රිසර්ච් එක කරනකොට සහ කරුණු කියවනකොට තේරුණේ, මේ සෙක්ෂුවල් ඇපීල් කියන එක, අපි යට ඇඳුම කියලා දැන් කිව්වට, ඉස්සර යට ඇඳුම ඇඳුමක් නෙවෙයි. සමහර වෙලාවට ඒක බොහෝ වෙලාවට නිවාරණය වෙච්ච, පොඩි නූල් ටිකක් විතරක් තිබ්බ, නැත්නම් පොඩි ආයිත්තමක්, ජුවෙලරි එකක් තමයි යට ඇඳුම වුණේ.”

මානව ශරීරයේ ඉනෙන් උඩ සහ පහළ යන කොටස් දෙක වෙන් වෙන්ව ආවරණය කිරීම සඳහා යට ඇඳුම් ඇඳ ඇති අතර ආචාර්යවරිය සඳහන් කළේ, ඉනෙන් පහළ කොටස ආවරණය කිරීම සඳහා අතීතයේදී මුල් තැනක් ලැබී ඇති බව ය.

කාලගුණික වෙනස්කම්වලින් ශරීරය ආරක්ෂා කර ගැනීම, ශරීරයට හැඩයක් ලබා ගැනීමට මෙන් ම සමාජ පන්ති වෙනස පෙන්වීමට ද යට ඇඳුම් භාවිත කළ බව ඇය සිය පර්යේෂණයේ සඳහන් කර තිබේ.

සිසිල් විලට් කනින්ටන් සහ ෆිලිස් කනින්ටන් The History of Underclothes (1992) නමැති කෘතියේ ද යට ඇඳුම්වල කාර්යභාරය ගැන සඳහන් කර ඇත. ඔවුන් පෙන්වා දෙන පරිදි ඉහත සඳහන් අරමුණුවලට අමතරව පිරිසිදුබව සඳහා ද මානවයා යට ඇඳුම් භාවිත කරයි.

යට ඇඳුම් සඳහා යොදා ගත් පැරණිතම අමුද්‍රව්‍යය ලිනන් බව ද ඔවුහු පෙන්වා දෙති. 19 වන සියවසේ මැද භාගයට පෙර, යට ඇඳුම් අතින් සදා ඇති අතර ඒවා ලිහිල් ආකාරයක් ගත් බව ද ඔවුන්ගේ කෘතියේ සඳහන් වෙයි.

වික්ටෝරියානු යුගයේදී, ශරීරයට තද යට ඇඳුම් ඇඳීමෙන් ශරීරය උණුසුම්ව තබා ගැනීමට උපකාරී වන බවට මිනිසුන් විශ්වාස කර ඇත.

අතීතයේදී, 17 වන සියවස වන තෙක් යට ඇඳුම් නූල් සහ රිබන් ආධාරයෙන් තද කර ඇඳ තිබේ. පසුව ඊට ආදේශකයක් ලෙස බොත්තම් පැමිණ තිබේ.

18 වන සියවසේදී, පළමු බොත්තම් වර්ගය ”igh-top” ලෙස හඳුන්වා ඇති අතර ඒවා කපු හෝ සිල්ක්වලින් සාදා ඇත. ඒකෝන් ගෙඩියක හැඩයෙන් යුක්ත වූ ඒවා 19 වන සියවස දක්වා ජනප්‍රියව පැවති බව සිසිල් විලට් කනින්ටන් සහ ෆිලිස් කනින්ටන් සඳහන් කරති.

**(බී.බී.සී. සිංහල සේවයේ පළවූ මෙම ලිපිය දීර්ඝ එකකි. මෙහි ඉතිරි කොටස www.yathranews.com වෙබ් අඩවියෙන් කියවිය හැකිය.)**

**ස්තුතිය බී.බී.සී. සිංහල සේවය**